# Kids පුංචි අපි

සංස්කරණය
චන්දි මාපා



Lakme Meemeduma 6Yrs



Panchadi Pasinduka Liyanaarachchi



Seneli Ramanayake



උදෑසන - සඳුනි මාලිම්බඩ 1 වසර




සුනෙල්ක හාල්පන්දෙනිය 1 වසර



Pandula Fernando Greenvale




මලින් මැනික්දිවෙල වයස අවු 9

## සුරංගනා කතා ඔබට ගෙනෙන පුංචි සුරංගනාවි




පුංචි කාලෙ සිටම සුරංගනා කතා වලට ආශා කළ තවමත් දස හැවිරිදි පුංචි රුවන්ති පසුගිය සතියේ ඇගේ කුළුඳුල් කෘතිය ''Fairy Dust and The Funny Man''එළි දැක්වූ වා. පසුගිය ජනවාරි 7 වන දා හියුම් සිටි කවුන්සිල් පුස්තකාලයේ දී ප්‍රවීණ ගත් කතු කේ ජයතිලක මහතා ගේ ලේඛණ දිවිය අගැයීමේ උත්සවයේ එක් කැපී පෙනුණ අංගයක් වූයේ මිල්පාක් ප්‍රාථමික පාසලේ ඉගෙනුම ලබන රුවන්ති විජේතුංග දැරිය විසින් පළ කරන ලද ඉහත කෘතිය වික්ටෝරියානු පාර්ලිමේන්තුවේ සැළසුම් ලේකම්වරිය වන ලිස් බීටි මැතිණියට පිළිගැන්වීමයි.



තවමත් ලාබාල වියේ පසුවන රුවන්තිට මෙවැනි හපන්කමක් කරන්නට අඩිතාලම වැටුණා අයුරු දැනගන්නට ඇගේ පියා අරුණ විජේතුංග හා මව ගීතානි විජේතුංග සමග සාකච්ඡා කරන්න සන්නස උත්සුක වුණා. වයස අවුරුදු දෙක වන්නටත් පෙර සිටම පොත් පත් වලට ආශා කළ රුවන්ති අක්කා සමග පොත් කියවන්නට පියාගේ කතන්දර වලට සවන් දෙන්නටත් ඒවා විස්තර කරන්නටත් හුරු පුරුදු වුණේ පෙර පාසලට අත්පොත් තබන්නටත් පෙර සිටයි. ප්‍රෙප් මට්ටමේදීම ලිවීමට හැකියාව පෙන්නුම් කළ ඇය පාසල් අධ්‍යාපනය ආරම්භ කිරීමත් සමගම වැඩි වැඩියෙ-න් කියවීමටත් ලිවීමටත් පටන් ගත්තා. කුඩා කවි ද ලියන්න පටන් ගත්තා. ගායනයට වාදනයට හා නැටුමටද රුවන්ති දක්ෂයි. පාසල් අධ්‍යාපන කටයුතු වලදී ද ඉහළ කුසලතාවක් පෙන්වන ඇය ගුරුවරුන්ගේ අගැයීමටද ලක්ව සිටින දක්ෂ දැරියකි.

රුවන්ති අතින් මුලින්ම නිර්මාණය වුණේ Thunder Shark 1 ඇය තුන් වන වසරේ ඉගෙනුම ලබද්දී Thunder Shark 2 ලියා අවසන් කළා. ඇය දැනට Green Elephant නමින් කතාවක් ලියමින් සිටිනවා. එයට වස්තු



බීජය වෙලා තියෙන්න් ඇගේ සෙල්ලම් බඩු පෙට්ටියේ සිටින කොලපාට අලියෙක්. ඇගේ නිර්මාණ එළිදැක්වීමට ඇයට උපකාර කළ ගුරුවරුන් මිතුරු මිතුරියන් මාපියන් සහ සොයුරිය සිහිපත් කරන්නට ඇය අමතක කළේ නැහැළු

ඇගේ කතා වලට චිත්‍ර අඳින්නේ ඇගේ වැඩිමහල් සොයුරිය සඳමාලි විජේතුංගයි.

ඔස්ට්‍රේලියාවේ ජීවත් වන ශ්‍රී ලාංකික දරු-වන් ශ්‍රී ලාංකික අපගේ පමණක් නොව ඔස්ට්‍රේලියානුවන්ගේ ද අගැයීමට ලක්වනු දකින විට අපට දැනෙන අභිමානය අතිමහත් ය. අනාගතයේ දක්ෂ ලේඛිකාවක වන ලකුණු දැන් සිටම පෙන්මි කරන රුවන්තිට අපේ සුබපැතුම්.

සටහන

මිල්පාක් සිංහල භාෂා පාසලේ ආචාරිණී
ශ්‍රියානි ජයවික්‍රම